# සමාජය තේරුම් ගැනීම

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර සහ
උපුල් ලේකම්ගේ විසිනි.
මානව හා සමාජවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

'සමාජය' යන්න සමාජ විද්‍යාවේදී මෙන්ම එදිනෙදා මනුෂ්‍ය ජීවිතයේදීත් අප අතර නිබඳව භාවිතා වන සංකල්පයකි. මෙය පොදුවේ යොදාගත්තක් සහ භාවිතා වන්නක් වන අතර, ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් උනන්දු වන්නේ සමාජය ඇසුරෙහි ජීවත් වන සාමාජිකයින්ගෙන් ස්වල්ප දෙනෙකි. සමාජ විද්‍යාව ඉගෙන ගන්නට කැමති ශිෂ්‍යයෙකුට සමාජය යන සංකල්පය පිළිබඳව නිවැරැදි අවබෝධයක් ලබා ගැනීම වැදගත් වන්නේ සමාජ විද්‍යාව යනු සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කරනු ලබන විෂයය වන බැවිනි.

සමාජය යන්න හැඳින්වීමට අප භාවිතා කරන Society නම් ඉංග්‍රීසි වචනයේ මුල් ස්වරූපය 'SoCius' යන ලතින් වචනයයි. එම ලතින් වචනයේ තේරුම 'සහායකයා' හෝ සහකරුවා. යන්නය. මෙයින් සමාජශීලිත්වය (Socia bility) පිළිබිඹු වේ. සමාජයෙහි පැවැත්මට මුල් වන්නේ සමාජශීලිත්වයයි. එනම් සමාජයේ සාමාජිකයන් අන්‍ය සමාජිකයන් ඇසුරේ දිවි පෙවෙත ගත කිරීමයි. අන් අය ඇසුරේ දිවි ගෙවීමට අපි සියල්ලෝම ප්‍රිය කරමු. හුදෙකලා වූ ජීවිතය ඒකාකාරීත්වයෙන්, පාළුවෙන් පිරුණු ජීවිතයක් බැවින් අපි විවිධ අවස්ථාවල්දී, විවිධ අවශ්‍යතාවන් උදෙසා විවිධ පුද්ගලයන් ඇසුරු කරමු. සමහර පුද්ගලයන් සුරතල් සතුන් ඇති කරන්නේත්, මල් වවන්නේත් තමන්ගේ පාළුව, තනිකම මකා ගැනීමේ උපක්‍රම ලෙසය. අන්‍යයන්ගේ ඇසුර නොමැතිව මිනිසාට දිවිගෙවීම බෙහෙවින්ම අසීරු බව "ඩැනියෙල් ඩෙෆෝ" විසින් රචිත රොබින්සන් කෘසෝ නම් ග්‍රන්ථය අපට පැහැදිලි කරයි. විවිධ කරුණු උදෙසා සමාජයෙන් වෙන් ව ජීවිත ගත කරන



පුද්ගලයන් සිටින බව ද අප අමතක නොකළ යුතුය. සම් යනු සැමතින්, ආජ් යනු එකට එකතුවීම, රැස්වීම යන අදහස ගනී, මෙසේ සෑදෙන සමාජ යන පදය සිංහල, පාලි, සංස්කෘත යන භාෂා වල පොදුවේ වහරට ගැනේ.

මේ ලිපිය රචනා කරන මමත්, එය කියවන ඔබත් මානව සමාජයේ සාමාජිකයෝ වෙමු. අපගේ උපතේ පටන් මරණය දක්වාම අපට සමාජයෙහි සමාජිකයන් වීමට සිදුව ඇත. එබැවින් අපි සියලු දෙනාම සාමාජීය සත්වයෝ වෙමු. වසර දහස් ගණනකට පෙර ග්‍රීක ජාතික සමාජ දාර්ශනිකයකු වූ ඇරිස්ටෝටල් මිනිසා සමාජීය සත්වයකු ලෙස හැඳින්වූයේ මේ නිසාය. මනුෂ්‍යයාගේ ජීව විද්‍යාත්මක පැවත්මට සමාජය අත්‍යවශ්‍යම සාධකයකි. තනි පුද්ගලයෙක් සමාජයක් විලස සැලකිය හැකි ද? එසේ නම්, ඊට හේතුව මොනවාද? සමාජගත ඇති මූලික ගති ලක්ෂණ කවරේ ද? විවිධ සමාජ පවතින්නේ ඇයි? සමාජවල නොයෙක් වෙනස්කම් තිබීමට හේතු මොනවා ද? කුහුඹු සමූහයක් මුව රැලක් , මාලු , ගව රංචුවක් සමාජ වශයෙන් සැලකිය නොහැකි ද? මෙබඳු ගැටලු සමාජය සම්බන්ධයෙන් වැඩිදුර කරුණු විමසීමේදී අපට වැදගත් වේ. සමාජයක් හඳුනා ගැනීමට සමාජයක ඇති ගති ලක්ෂණ (Characteristics) විමසා බලමු.

මානව සමාජය පුද්ගලයන්ගෙන් සමන්විත වී ඇත. පුද්ගලයන් සමූහයක් නොමැති විට සමාජයක් පැවතිය නොහැකිය. එනම්, එක් අයෙකු පමණක් සමාජයක් සේ සැලකීමට අසීරුය. මොරිස් ගින්ස්බර්ග් සමාජය පිළිබඳ සපයා ඇති නිර්වචනයෙන් ද සමාජය පුද්ගලයන්ගෙන් සමන්විත වූවක් බව අවධාරණය කරයි. ඔහු පවසන පරිදි සමාජය යනු පුද්ගලයන්ගේ එකතුවකි.

මැක් අයිවර් නම් සමාජ විද්‍යාඥයාගේ අදහස පරිදි සමාජය යනු "සමාජ සම්බන්ධතා ජාලයකි" සමාජ සම්බන්ධතා ජාලයක් නිර්මාණය කිරීමට තනි පුද්ගලයකුට නොහැකිය. ඒ සඳහා අවම වශයෙන් දෙදෙනකුට වැඩි ගණනක් සිටිය යුතුය. අපට එදිනෙදා කාර්යයන් හීදී විවිධ පුද්ගලයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සිදුවේ. උදෑසන අවදි වූ මෙහොතේ පටන් ම රාත්‍රී නින්දට යනතුරුම අපගේ දෛනික ක්‍රියාකාරකම් ගැන

මෙනෙහි කරන්න. අපි අපගේ පැවැත්ම පිණිස අන් අය සමඟ කටයුතු කරන්නෙමු. සමාජ සම්බන්ධතා ජාලය නිර්මාණය වන්නේ විවිධ අවශ්‍යතා උදෙසා නොයෙක් පුද්ගලයින් එකිනෙකා සමඟ සම්බන්ධ වන බැවිනි. මේ සමාජ සබඳතා ජාලය නිසා එනම් අන්තර් පුද්ගල ක්‍රියාකාරිත්වය නිසා සමාජයේ වෙසෙන පුද්ගලයෝ සමූහ වශයෙන් සංවිධානය වෙති. මෙලෙස සංවිධානය වන පුද්ගලයන් ඇසුරෙන් සමාජයේ පැවැත්මට උරදෙන සමාජ සංවිධාන සමාජ ආයතන, සහ සමාජ සංස්ථා යනාදිය ගොඩ නැගෙනු ඇත.

සමාජයක ජීවත්වන පුද්ගලයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය නිසා මිනිසුන් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් ගොඩ නැගේ. අපි සියලු දෙනා සමගම එකම ආකාරයේ සම්බන්ධතා නොපවත්වන්නෙමු. විවිධ පුද්ගලයින්ගේ වයස, තත්වය,, ලිංගිකත්වය මත අපගේ චර්යා රටාවන් වෙනස් වන්නේය. අපගේ වැඩිහිටියන්, ගුරුවරයන්, යහලු යෙහෙළියන්, රජයේ නිලධරයන් ගැන මොහොතක් සිතා බලන්න. අපි මේ සියලු දෙනා සමඟම ඇලෙන ගැටෙන අතර, ඔවුන් හා අප අතර ඇති සබඳතා රටාවන්හි වෙනස පිළිබඳ අප දෙපාර්ශවයටම මනා අවබෝධයක් පවතී, මෙලෙසින් සියලුම පුද්ගලයන් තම තමන්ගේ චර්යා රටාවන් වල සීමාවන් හඳුනාගෙන හැසිරීම මඟින් අපගේ අන්තර් ක්‍රියාකාරිත්වය නොනවත්වා පවත්වාගෙන යා හැකිය. සමාජයෙහි වෙසෙන අය තුළ අන්‍යෝන්‍ය අවබෝධය ඉතා හොඳ මට්ටමක පවතී නම් සමාජයම ගැටලු බොහෝ දුරට අවම කර ගත හැකිය.

සමාජයක දැකිය හැකි තවත් ලක්ෂණයක් නම් සමානාත්මතාවයයි. කිසියම් සමාජයක පැවැත්ම සඳහා සමානාත්මතාවය අත්‍යවශ්‍ය සාධකයකි. පුද්ගලයන්ගේ අවශ්‍යතා අරමුණු අගනාකම් ආකල්ප, ආදිය සමාන වන්නේ නම් එම සමාජයේ පැවැත්මට එය බෙහෙවින් ඉවහල් වේ. සමාජ විඥානය (Social consciousness) ගොඩ නැගෙන්නේ මේ ආකාරයට ය. එක සමාන පුද්ගලයන් සමූහ වශයෙන් ගොනුවන විටදීය. මෙලෙස ගොනුවන පුද්ගලයන් නිසා සමාජයෙහි සුරක්ෂිත භාවය ස්ථිර වන්නේ ය.





සමානාත්මතාවය මෙන් ම විවිධත්වය (Difterence) සමාජයේ පැවැත්මට උපකාරී වන්නේය. සමාජයේ සිටින්නා වූ සියලු දෙනාම එක හා සමාන ආකල්ප, අරමුණු, අගනාකම්, ප්‍රතිමාන අවශ්‍යතා ප්‍රකට කරන්නේ නම් එම සමාජයෙහි ඒකාකාරිත්වය එහි පැවැත්මට හිතකර නොවේ. බාධාවකි. ලෝකය හින්න රුචිකය එවැනි ඒකාකාරී සමාජයක් ප්‍රගතිය කරා පිය ඔසවන්නේ නොවේ. කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද පුද්ගලයන් විවිධ වූ තරමට සමාජයෙහි විවිධත්වය අධික වන්නේය. නොයෙක් ආර්ථික සංස්කෘතික, දේශපාලනික, ආගමික රටාවන් සමාජයක පැවතීමෙන් එහි අන්තර් පුද්ගල ක්‍රියාකාරිත්වය බහුවිධ ස්වරූපයක් ගනී.

සහයෝගීතාව (Solidarity) සහ ශ්‍රම විභජනය (Division of labour) ද සමාජයෙහි ඇති තවත් ලක්ෂණ දෙකකි. සහයෝගීතාව දැකිය හැකි වන්නේ ජනතාවගේ සාමාජීය කාර්යයන්හීදීය. අපගේ සමහර කාර්යයන් අප විසින් තනිවම ඉටු කර ගත්තද, තවත් බොහෝ කාර්යයන් සඳහා අපට අන් අයගේ උදව් උපකාර අවශ්‍ය වන්නේය. එලෙසම අන් අයද ඔවුන්ගේ කාර්යයන් සඳහා අපගේ ආධාර උපකාර බලාපොරොත්තු වෙති. මෙමගින් අන්‍යෝන්‍ය පරායත්තතාවත් (Dependency - යැපීමත්) ගොඩ නැගෙන අතර, සහයෝගීතාවද වර්ධනය වන්නේය. බොහෝ පොදු මෙන්ම පෞද්ගලික කටයුතු වලදී ද? මෙම සාමූහික චර්යා රටාවන් අපගේ සාමාජීය අභියෝග ජය ගැනීමට අපට මහෝපකාරී වන්නේය.

ශ්‍රම විභජනය යනුවෙන් හඳුන්වන්නේ විවිධ කාර්යයන් අප අතර බෙදී ඇති ආකාරයයි. සමාජය තුළ අපට විවිධ කාර්යභාරයන් වෙන්වී ඇත. නිදසුන් ලෙස පවුල නැමති සමාජීය ඒකකය සලකා බලන්න. ස්වාමියා, ඔහුගේ බිරිඳ හා දරුවන්ට අවශ්‍ය ආහාර පාන, ධනය , ආරක්ෂාව යනාදිය සැපයිය යුතුය. බිරිඳ දරුවන් බිහි කරමින් ඔවුන් පෝෂණය කරමින් ආහාරපාන සකසමින් ගේ දොර පාලනය මැනවින් පවත්වාගෙන යා යුතුය. සමාජයෙහි වෙසෙන පුද්ගලයන් පිළිබඳව සැලකුවද මෙලෙස පවතින ශ්‍රම විභජන රටාවක් දැකිය හැකිය. ශ්‍රම විභජන රටාව සමාජයෙහි ස්වභාවය අනුව වෙනස් විය හැකිය.

සමාජයෙහි ඇති ගතික ස්වභාවය (dynamic) එනම් වෙනස්වන සුලු බව තවත් ලක්ෂණයකි. සෑම සමාජයක්ම වෙනස් වන්නේය. වෙනස් නොවන සමාජ පැවැත්මේ තර්ජනයට මුහුණ පාන බව ප්‍රායෝගික සත්‍යයක් වේ. මානව සමාජය දිනෙන් දින වෙනස් වන බැවින් අපගේ ආකල්ප, අරමුණු, අගනාකම්, සිරිත් විරිත් යනාදියද කලින් කලට වෙනස් වන්නේය. එලෙසම සමාජ සංස්ථා ආයතන සංවිධාන ආදිය ද වෙනස්වීම් වලට භාජනය වන්නේය. මේ වෙනස්කම් බොහෝවිට කාලාන්තරයක් තිස්සේ සිදුවිය හැකි බවක් මෙන්ම ක්ෂණිකව සිදුවන අවස්ථා ද තිබේ.

සමාජයක පවතින සමාජ පාලන රටාවද (Social control method) සමාජයක දැකිය හැකි තවත් ප්‍රධාන ලක්ෂණයකි. සෑම සමාජයකටම ඊට ආවේණික වූ විධිමත් හෝ අවිධිමත් (Formal or informal) සමාජ පාලන උපාය විධි ක්‍රියාත්මක වන්නේය. සෑම සමාජයකම සාමාජිකයන් අතර ගැටුම් මතුවිය හැකිය. සමාජ සමූහ අතර පවතින ආතතිය පීඩනය, තරගකාරිත්වය වැනි හේතු නිසා සමාජය සමන්විත වී ඇති අංගවලට බලපෑම් ඇති වන්නේය. මේ ගැටුම් ආර්ථික, දේශපාලනික, ආගමික, වාර්ගික හා අධ්‍යාපනික වශයෙන් පැවතිය හැකිය. මෙවැනි ගැටුම් පැවතීම සමස්තයට බාධාවකි. එබැවින් එය යම් ප්‍රමාණයකට හෝ මැඩ පවත්වා සමස්තයට පෙර පැවති තත්ත්වයට පත්කළ යුතු වන්නේය. බොහෝවිට මේ සඳහා විවිධ සමාජ පාලන ක්‍රමෝපායයන් විවිධ සමාජවලදී උපයෝගී කරගනී. චාරිත්‍ර, සම්ප්‍රදායයන්, ජනවහර, ධර්මතා වැනි අවිධිමත් සමාජ පාලන ක්‍රම මෙන්ම අධ්‍යාපන, නීතිය වැනි විධිමත් සමාජ පාලන ක්‍රමද අනුගමනය කරනු ලැබේ.

සෑම සමාජයක්ම අන් සමාජවලට වඩා වෙනස් බව විවිධ සමාජවල විස්තර කියවා ඇති ඔබ මේ වන විට තේරුම් ගෙන ඇතැයි සිතමි. මීට හේතුව වන්නේ එක් එක් සමාජය ඇසුරේ පවතින සංස්කෘතියයි. රැල්ෆ් ලින්ටන් නම් මානව විද්‍යාඥයා කියන අයුරින් සංස්කෘතිය වන්නේ "මනුෂ්‍යයාගේ සමාජ උරුමයයි" (Social heritage of





man) පොදුවේ සංස්කෘතිය වශයෙන් අර්ථ දැක්වෙන්නේ යම් සමාජයක පවතින ජීවන රටාවයි. යම් සමාජයක සාමාජිකයන් වශයෙන් අප සතු දේශපාලනික, ආගමික, ආර්ථික, නෛතික මෙන්ම අධ්‍යාපනික, විද්‍යාත්මක, සදාචාරාත්මක ආකල්ප, වටිනාකම්, විශ්වාස පද්ධති, නිගමන, සිරිත් විරිත් සියල්ල සංස්කෘතියෙහි අඩංගු වේ. සමාජයෙහි වාසය කරන්නා වූ සියලුම පුද්ගලයන් එකිනෙකා බැඳ තබන්නේ සංස්කෘතියයි.

## සමාජ ව්‍යූහය

සමාජයක් පවත්වාගෙන යාමට උපකාරිවන තවත් හේතු සාධකයක් නම් සමූහ වශයෙන් දිවිගෙවීමට මිනිසුන් තුළ ඇති කැමැත්තයි. මනුෂ්‍යයා උපත ලබන්නේ යම්කිසි සමාජයකය. ඔහු ඒ ඇසුරේ දිවි ගෙවමින් ඉන් තම පෞරුෂය පෝෂණය කර ගනී. තම සියලු පෞද්ගලික අවශ්‍යතා උදෙසා ඔහු හෝ ඇය සමාජය මත්තේ යැපෙනු ඇති සමාජය අපට ජීවත්වීමට හිතකර පරිසරයක් මවාදෙන බැවින් අපට සමාජයෙන් තොර දිවි පෙවෙතක් ගැන සිතීම උගහටය. සමාජය අපගේ පුද්ගල උන්නතිය පිණිස අවශ්‍ය වන නිදහස අපට සපයා දෙන්නා සේම සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් අප ඈත්කර තබයි.

සෑම සමාජයකටම ඊට උරුම ව්‍යූහයක් ඇත. යම් සමාජයක ව්‍යූහය හඳුනා ගැනීම එම සමාජය අවබෝධ කර ගැනීමට ඇති පහසුම ක්‍රියා මාර්ගයකි. මේ ව්‍යූහය සමාජයෙන් සමාජයට වෙනස්විය හැකි අතර සමාජ වෙනසත් සමඟම ව්‍යූහයෙහි වෙනස්කම් සිදුවීම ද අනිවාර්ය වේ. සමාජ ව්‍යූහයට අඩංගුවන කොටස් ඒවාට නියමිත කාර්යයන් ඉටු කරමින් සමාජය නමැති සමස්තය පවත්වාගෙන යැමට උපකාරී වේ. මේ සමස්තය සඳහා සමාජයේ සියලුම සාමාජිකයෝ දැනුවත්ව හෝ නොදැනුවත්ව තම දායකත්වය පුදකරති සමාජ ව්‍යූහය වටහා ගැනීමට එක් එක් පුද්ගලයා අධ්‍යයනය කිරීමෙන් පලක් නොවන අතර, එම විවිධ පුද්ගල සමූහ එකතු වී

ගොඩ නගන ආයතන සංස්ථා යනාදියෙහි ව්‍යුහය හා කාර්යභාරය අධ්‍යයනය කළ යුතුය.

සමාජ ව්‍යුහය සමාජ විද්‍යාවේ වැදගත් මූලික සංකල්පයකි. ව්‍යුහය යනුවෙන් අප එදිනෙදා ව්‍යවහාරයේදී භාවිතා කරන්නේ යම් කිසි දෙයක් නිර්මාණය වී ඇති ආකාරය හා හැදින්වීමටය. එකිනෙකට බැඳී ඇති කොටස් වලින් ව්‍යුහයක් නිර්මාණය වේ. මනුෂ්‍ය ශරීරයේ ව්‍යුහය ගැන විමසා බැලීමේදී එය එකිනෙකට බැදුණු විවිධ ස්වරූපයේ අංග ගණනාවක සංයෝග වීමක් බව අපට වැටෙහෙනු ඇත. සමාජය ද එලෙස විවිධ කෘත්‍ය ඉටුකරන නොයෙක් ස්වරූපයේ අංග ගණනාවක එකතුවක් බව සමාජයේ ව්‍යුහය පිළිබඳව තොරතුරු සොයන අපට තේරුම් යනු ඇත. කෘත්‍යවාදීන්ගේ අදහසට අනුව ආගම. දේශපාලනය, අර්ථක්‍රමය, නීතිය, අධ්‍යාපනය වැනි විවිධ ස්වරූපයේ අංග ඒවාට අනුරූප කාර්යයන් ඉටු කරමින් සමස්ත සමාජය පවත්වාගෙන යෑමට අවශ්‍ය පරිසරය සකස් කර දෙයි.

සමාජ ව්‍යුහය යන සංකල්පය සමාජ විද්‍යාත්මක මෙන් ම මානව විද්‍යාත්මක අධ්‍යයනවලදී ද නිබඳවම භාවිතා කරන්නකි. 16 වැනි සියවසේදී පමණ මේ සංකල්පය උපයෝගී කොට ගත්තේ ඕනෑම දෙයක් නිර්මාණය වී ඇති කොටස් වල අන්තර් සම්බන්ධතාව පෙන්වීමටය. සමාජ විද්‍යාවේදී මෙය ප්‍රචලිතව යොදා ගනු ලැබුවේ වර්ෂ 1850න් පසුවය. හර්බට් ස්පෙන්සර් සහ එමිල් ඩුර්කයිම් සමාජය විග්‍රහ කිරීමට යොදාගනු ලැබුවේ 'ව්‍යුහය' නම් සංකල්පයයි. ඉන් අනතුරුව මේ සංකල්පය සමාජය විග්‍රහ කිරීමට යොදාගත් සමාජ විද්‍යාඥයන් හා මානව විද්‍යාඥයන් ලෙස කාල්මාක්ස් ලුවී එච්, මෝගන්, ජෝර්ජ් පීටර් මර්ඩොක්, ඒ. ආර් රැඩ්ක්ලිෆ් බ්‍රවුන් සහ ක්ලෝඩ් ලෙවී ස්ට්‍රවුස් වැන්නෝ කැපී පෙනෙති. ව්‍යුහය යන සංකල්පයෙන් කොටස් හෝ අංග රැසක් ක්‍රමවත් සැලැස්මක් විස්තර කෙරේ. මෙය තවදුරටත් හොඳින් වටහා ගැනීමට ගොඩ නගා ඇති නිවසකුත්, නිවාස තැනීමට උපයෝගී කර ගන්නා ගල්, වැලි, සිමෙන්ති, ලී






දඬු, වීදුරු, තහඩු වැනි වෙනත් බොහෝ භෞතික ද්‍රව්‍යගැනත් සිතන්න. එම ද්‍රව්‍ය වෙන වෙනම තිබීමෙන් කිසිම දිනක ක්‍රමවත් සැලැස්මක් ගොඩ නොනැගෙනු ඇත. එකිනෙකට එකක් ක්‍රමවත් ලෙස සංයෝග කිරීමෙන් අපට අවශ්‍ය ව්‍යුහය ගොඩනගා ගත හැකිය. ඔබ දැක පුරුදු නිවාස සියල්ලම එක සමාන නොවේ. එනම් ව්‍යුහයෙහි යම් යම් වෙනස්කම් දැකිය හැකිය. මේ අයුරින් ව්‍යුහය වෙනස් වන්නේ විවිධ අංග සංයෝග කර ඇත්තේ විවිධ ආකාරයෙන් බැවිනි. සමාජය ද මේ අයුරින්ම විග්‍රහ කළ හැකිය. සියලුම සමාජවල එකම ව්‍යුහය දක්නට නොහැකිය. නොයෙක් සමාජවල ව්‍යුහය වෙනස් වන්නේ එම ව්‍යුහය නිර්මාණය කරන අංග හෝ කොටස් වල ඇති වෙනස්කම් නිසාවෙනි. සමාජයෙහි ව්‍යුහය තනනු ලබන්නේ එහි වසන්නාවූ පුද්ගලයන් විසිනි. පුද්ගල විවිධතා නිසා එනම් පුද්ගලයින් විවිධාකාරයෙන් සංයෝග වීම නිසා විවිධ සමාජයන් හි ව්‍යුහමය වෙනස්වීම් හඳුනාගත හැකිය.

බොහෝ සමාජවල සාමාජිකයෝ මරණ සංක්‍රමණය වැනි කාරණා හේතු කොටගෙන සමාජයෙන් බැහැර වෙති. එහෙත් සමාජය එහි ව්‍යුහය නොකඩවා පවත්වාගෙන යාමට සමත් වේ. නිදසුන් ලෙස පවුල් සංස්ථාව සලකන්න. පවුල්වල පුද්ගලයෝ මියයති. එහෙත් තව සාමාජිකයෝ එම සංස්ථාව නොනැසී ඉදිරියටම පවත්වාගෙන යති මෙලෙසම පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉවත් වුවද විදුහල්පතිතුමා හෝ ගුරුවරු ස්ථාන මාරුවීම් ලබාගෙන ගියද පාසල නමැති ආයතනය අක්‍රිය වන්නේ නැත. නවක සිසුන් පාසලට ඇතුළු වන අතර, ගුරුවරුන් වෙනුවට අනුප්‍රාප්තිකයෝ පත්වෙති. මේ නිදසුන් වලින් පෙනී යන්නේ ව්‍යුහය නොනැසී පවත්වාගෙන යාමට සමාජයේම සමාජිකයන් වෙර දරන බවයි. මන්ද, සමාජයේ සාමාජිකයන්ට පැවැත්මක් ඇතිවන්නේ ව්‍යුහයට සම්බන්ධවීමට අවස්ථාවක් ලදහොත් පමණි. ව්‍යුහය විනාශවී ගියහොත් ඔවුනට පැවැත්මක් නැත. එමනිසා පවතින ව්‍යුහය රැක ගැනීමට ඔවුහු සිය උපරිම උත්සාහය යොදති.

සමාජ ව්‍යුහය නිර්මාණය වී ඇති රටාව බර්නාඩ් පිලිප්ස් විසින් ඔහුගේ සමාජ විද්‍යාව නමැත් ග්‍රන්ථයේ සංක්ෂිප්තව දක්වා ඇත්තේ මෙසේ ය.




ඉහත දැක්වූ රටාවට අනුව සමාජ ව්‍යුහය රඳා පවතින්නේ සමාජ සංවිධානය හා සංස්කෘතිය මතය. සංස්කෘතියේ මූලික අංග ලෙස ධර්මතාව සහ අගනාකම් හඳුනාගත හැකිය. ඒවා කෙරෙහි පිළිවෙලින් අපේක්ෂා හා පරමාර්ථ බලපානු ලැබේ.

සමාජ සංවිධානය , සමාජ සබඳතා මත රැඳී පවතින අතර, සමාජ සබඳතා තීරණය වන්නේ සමාජ අන්තර් ක්‍රියාවන්හි ස්වභාවය අනුවය. සමාජ ව්‍යුහය සමාජ සම්බන්ධතාවන්ගෙන් යුක්ත සංකීර්ණ කාර්ය පද්ධතියකි. එම සමාජ ව්‍යුහය ක්‍රියාත්මක වන ආකාරය සමාජ සංවිධානය වේ.

"අඛණ්ඩව සිදුවන ඕනෑම හැසිරීම් රටාවක්" සමාජ ව්‍යුහය ලෙස පොදුවේ අර්ථ දැක්වෙයි. එහෙත් මෙය එතරම් සංකීර්ණ එමෙන්ම විස්තරාත්මක විග්‍රහයක් නොවේ. සමාජ ව්‍යුහය යනු කුමක් දැයි අර්ථ කථනය කිරීමට උත්සාහ කළ සමාජ හා මානව විද්‍යාඥයන් පවසන්නේ, සමාජ ව්‍යුහය යනු " සමාජයෙහි ඇති අංග අතර පවතින ක්‍රමවත්, රටාවක් රටානුගත සම්බන්ධතාවන් බවය. නමුත් ඔවුන් අතරම මේ අංග මොනවාදැයි. යන්න පැහැදිලි එකඟතාවක් නැත. ඒ . ආර්. රැඩික්ලිෆ් බ්‍රවුන් පවසන්නේ මිනිසුන් අතර පවතින පොදු හා ක්‍රමවත් සම්බන්දතාවයක් මේ අංග ලෙස විස්තර කළ හැකි බවය. එස්. එෆ්.





නාඩෙල්ගේ අදහස පරිදි මේ අංග අන් කිසිවක් නොව සමාජයේ සාමාජිකයන් ඉටුකරන කාර්යභාරයන්ය. කෘත්‍යවාදීහු මෙයට වෙනස් වූ අදහසක් දරති. ඔවුන් පවසන්නේ මේ අංග සමාජ සංස්ථා බවය. සමාජ සංස්ථා නොමැතිව සමාජයකට පැවතිය නොහැකි බවට ඔවුහු තර්ක කරති. කෘත්‍යමය පූර්ව අවශ්‍යතාවයන් සපුරා ගැනීමට සමාජ සංස්ථා අත්‍යවශ්‍ය බව ඔවුහු පිළිගනිති. මොරිස් ගින්ස්බර්ග් ද මීට සමාන මතයක් දරයි. ඔහු කියන අයුරින් සමාජ ව්‍යුහය යනු සමාජය නිර්මාණය වී ඇති මූලික සමූහ සහ සංස්ථාවන්හි එකතුවයි.

වර්තමානයේ සමාජ ව්‍යුහය යන සංකල්පය යොදා ගන්නේ කුඩා සමාජ සමූහ මෙන්ම විශාල ප්‍රජාවන් සහ සමාජ පිළිබඳ අධ්‍යයන කටයුතු වලදීය. මේ හේතුව නිසා ඩබ්. එෆ්. ඔග්බර්න් සහ එම්. එෆ්. නිම්කොෆ් සමාජ ව්‍යුහය ලෙස සලකන්නේ සමාජයේ වෙසෙන පුද්ගල සමූහවල සංවිධානාත්මක බවයි. ඒ. ආර්. රැඩික්ලිෆ් බ්‍රවුන් විසින් සමාජ ව්‍යුහය යම් සමාජයක පවතින්නා වූ සම්බන්ධතාවන්හි සංකීර්ණ පද්ධතියක් ලෙස විග්‍රහ කළද ඒ එතරම් සාර්ථක නිර්වචනයක් නොවේ. ඊට හේතුව ඔහු විසින් මේ සංකිර්ණ පද්ධතිය කවරක්දැයි හඳුන්වා නොදුන් නිසාය. එනමුත් ඔහු විසින් ඉදිරිපත්කොට ඇති අනෙක් අර්ථ නිරූපණය ඊට වඩා සවිස්තරව සමාජ ව්‍යුහය යන්න හඳුන්වා දෙයි. එනම් සමාජ ව්‍යුහය වූ කලී සමාජ සංස්ථාවන් මගින් පාලනය කරන හෝ නිශ්චිතව සඳහන් කරන සම්බන්ධතාවන් දරණ පුද්ගලයන්ගේ සැකැස්මක් ලෙසය.

එවන්ස් ප්‍රිඩාර්ඩ් සමාජ ව්‍යුහය නිර්වචනය කර ඇත්තේ යම් සමාජයක පවතින කුඩා සාමාජ කණ්ඩායම් එනම් පවුල්, ඥාති සමූහ වැනි කණ්ඩායම් කුඩා ඒකක එනම් ගම, පළාත, ප්‍රජාව වැනි කණ්ඩායම් සමග සම්බන්ධ කරන සාපේක්ෂ වශයෙන් දිගුකල් පවතින සම්බන්ධතාවන් ලෙසය.

සමාජයේ වෙසෙන සියලුම පුද්ගලයන්ගේ ආරක්ෂාව සුරක්ෂිත වන්නේ ඔවුන් සමූහ වශයෙන් සංවිධානය වූ විට ය. මෙලෙස සංවිධානය වූ විට ඔවුන්ගේ මූලික ආර්ථික, සාමාජීය, ජෛවවිද්‍යාත්මක, දේශපාලනික, ආගමික, මනෝ විද්‍යාත්මක අවශ්‍යතාවන් සපුරාගත හැකිය. මේ අවශ්‍යතා සපුරා ගැනීමට විවිධ සමාජ අනුගමනය කරන ක්‍රියා මාර්ග වලින් එම සමාජයේ ව්‍යුහය නිර්මාණය වන්නේය. නිදසුන් ලෙස යම් කිසි සමාජයක පාලන රටාව (දේශපාලන) සලකා බලන්න. ගෝත්‍රික සමාජයක ගෝත්‍රික

නායකයා පාලකයා වන අතර, අන් අය ඔහුගේ අනුගාමිකයෝ වෙති. මෙය ඉතා සරල පාලන රටාවකි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ඇති සමාජයක දේශපාලන ක්‍රියා දාමයට එම සමාජයේ සියලුම සමාජිකයෝ දායක වෙති. ඒකාධිපති පාලන රටාවක් ඇති සමාජයක් ඉහත සමාජ දෙකටම වඩා වෙනස්ය. එනම් ආකාර තුනක ව්‍යුහයන් මේ සමාජ තුනෙහි දැකිය හැකිය.

ඉහත කරුණු සලකා බැලීමේදී අපට හැඟී යන්නේ සමාජයක පවතින්නා වූ සැලැස්ම සමාජ ව්‍යුහය බවයි. මේ සමාජ ව්‍යුහය, එම සමාජයන්හි දැකිය හැකි ස්වභාවය අනුව කොටස් දෙකකට වෙන්කර දැක්විය හැකිය. එනම් තථ්‍ය ව්‍යුහය සහ විධිමත් ව්‍යුහය යනුවෙනි. මේ සංකල්ප දෙක ඉදිරිපත් කරමින් රැඩ්ක්ලිෆ් බ්‍රවුන් පැවසුවේ සලකන ලද ඕනෑම මෙහොතක සත්‍ය වශයෙන්ම පවතින සමාජ සබඳතා රටාව තථ්‍ය ව්‍යුහය වශයෙනි. මේ ආකාරයේ සමාජ සම්බන්ධතා ඕනෑම අයෙකුට නිරීක්ෂණය කළ හැකිය. විධිමත් ව්‍යුහය එසේ නොවේ. යම්කිසි සමාජයක වෙසෙන ජනතාව දීර්ඝ කාලයක් ඔස්සේ පවත්වාගෙන යන සමාජ සබඳතා රටාවන්ය. මේ වර්ගයේ සබඳතා සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවතී, සමාජයේ පවතින තථ්‍ය ව්‍යුහය , එනම් සලකන ලද ඕනෑම මෙහොතක සත්‍යවශයෙන්ම පවතින සමාජ සබඳතා රටාවන් නිරන්තරයෙන්ම වෙනස් වේ. නිදසුන් ලෙස අපගේ දෛනික සබඳතා රටාවන් කෙරෙහි අවධානය යොමු කරමු. විධිමත් ව්‍යුහය ද වෙනස්වන නමුත්, තථ්‍ය ව්‍යුහය මෙන් ක්ෂණිකව වෙනස් නොවේ. එසේ වුවද එයද ක්‍රමයෙන් වෙනස් වේ. මීට වසර කීපයකට පෙර විස්තෘත පවුල් රටාවක් අත්විඳි අපි දැන් ක්‍රමයෙන් න්‍යෂ්ටික පවුල් රටාවක් දක්වා නැඹුරු වෙමින් සිටිමු. කාලාන්තරයක් තිස්සේ සිදුවන සමාජ වෙනස නිසා විධිමත් ව්‍යුහය වෙනස් විය. හැකිවාක් මෙන්ම, ක්ෂණිකව සිදුවන යුද්ධ, කැරලි කෝලාහල, විප්ලව වැනි ක්‍රියා මාර්ග හේතුකොටගෙන විධිමත් ව්‍යුහය හදසියේම වෙනස් විය හැකිය.

සමාජ ව්‍යුහයේ ස්වභාවය වටහා ගැනිමට එය නිර්මාණය වී ඇති අංග පිළිබඳව විමසිලිමත් වෙමු. හැරී එම්. ජොන්සන් විසින් ඔහුගේ සමාජ විද්‍යාව, ක්‍රමානුකූල හැඳින්වීමක් යන ග්‍රන්ථයේ සමාජ ව්‍යුහයේ ප්‍රධාන අංග සතරක් මෙසේ විස්තර කර තිබේ.





සමාජ ව්‍යුහය නිර්මාණය වීමේදී සමාජයේ ඇති විවිධ වර්ගයේ උප සමූහ ඉටු කරන්නේ ප්‍රබල මෙහෙවරකි. සමාජය යනු ප්‍රමාණයෙන් ඉතා විශාල වූ සමූහයකි. මේ විශාල සමූහය තුළ එය නිර්මාණය වන උප සමූහ විශාල වශයෙන් ඇත. විවිධ ආගමික, දේශපාලනික, ආර්ථික, අධ්‍යාපනික සමූහ මෙවැනි උප සමූහ ලෙස සමාජයෙහි දැකිය හැකිය. මහා සමාජයෙහි වෙසෙන සියල්ලෝම මේ උප සමූහ වල සාමාජිකයන් ලෙස සිටිමින්, ඔවුනොවුන් හා අන්තර් ක්‍රියා කරමින් ජීවත් වෙති.

සමාජ ව්‍යුහය හඳුනා ගැනීමට වැදගත්වන තවත් ලක්ෂණයක් නම් එම සමාජයේ සාමාජිකයන්ගේ භූමිකාවන්ය. එනම් ඔවුන් ඉටු කරන කාර්යභාරයන් ය. මහා සාමාජයේ මෙන්ම උප සමූහවල වසන්නන්ටද විවිධ වර්ගයේ භූමිකාවන් උරුමව ඇත. මෙම භූමිකා රඟපෑම නිසා ඇතිවන අන්තර් ක්‍රියාකාරිත්වය මඟින් සමාජ ව්‍යුහය නොකඩවා පවත්වාගෙන යා හැකිය. මේ භූමිකාවන් හා බැඳුනු අයිතිවාසිකම් මෙන්ම යුතුකම්ද නිශ්චිතව සමාජය මඟින් පෙන්වා දී ඇත. මේ අයිතිවාසිකම් හා යුතුකම් නිසා උප සමූහ වල වෙසෙන්නන් මහා සමාජය සමඟද සම්බන්ද වී සිටිති. මේ උප සමුහ හා භූමිකාවන් බැඳී පවතින ධර්මතා රටාවන්ද සමාජ ව්‍යුහය තුළ දක්නට තිබේ. හැරී එම්. ජොන්සන් මේ ධර්මතා රටාවන් කොටස් දෙකකට වර්ග කර ඇත.

### (1) බන්ධනීය හෝ ඥාතිත්ව ධර්මතාවන්

මේ ආකාරයේ ධර්මතාවන් සෑම භූමිකාවකටම සහ සෑම උප සමුහයකටම එකලෙස අදාළ වන්නේ නැත. නිදසුන් ලෙස පියකු හා පුතකු අතර පවතින සබඳතාව සලකන්න පියාගෙන් පුතාටත්. පුතාගෙන් පියාටත් ඉටුවිය යුතු යුතුකම් මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම්ද අපට වෙන වෙනම වටහා ගත හැකිය. එමෙන්ම පවුලක සාමාජිකයින් ඔවුනොවුන් හැසිරීමේදී ඇතිකර ගන්නා වූ සබඳතා රටාවන් අපගේ රැකියා ස්ථානයේදී අප ඇති කර ගන්නේ නැත. මීට හේතුව පවුල සහ රැකියා ස්ථානය යන උප සමූහ දෙක තුළ පවතින ධර්මතා මාලාව හෝ රටාව කෙරෙහි අපගේ සිත්තුළ ඇති අවබෝධයයි.

## (2) නිර්බාධිත හෝ යාමක ධර්මතා

නිර්බාධිත හෝ යාමක ධර්මතාවන් මෙලෙස හඳුනා ගනිමු. අප සාමාජයෙහි සාමාජිකයන් වශයෙන් දිවි ගෙවීමේදී සමහර ක්‍රියාවන් කළ යුතුමය. සමහර ක්‍රියාවන් කිරීමටත්, නොකර සිටීමටත් පුළුවන. තවත් සමහර ක්‍රියාවන් කිරීමට කිසිදු ඉඩක් නැත. මෙවැනි ආකාරයේ ධර්මතාවන් සඳහා නිදසුන් අප සමජයෙන් නිරතුරුවම සොයා ගත හැකිය. දෙමව්පියන්ට තම දරුවන් රක්‍ෂා කිරීමේ වගකීම පැවරී තිබේ. එය ඔවුන් විසින් ඉටුකළ යුතුමය. සමාජයේ වෙසෙන අය විවාහ විය යුතුයයි අනිවාර්ය නීතියක් නැත. එමනිසා යමකුට අවශ්‍ය නම් විවාහ විය හැකි වන අතර, නොඑසේ නම් විවාහ නොවී ජීවිතය තනිකඩව ගතකළ හැකිය. අප විසින් නොකළ යුතුයයි සමාජයේ සාම්ප්‍රදායිකව පවතින ධර්මතාවන් ද පවතී. ව්‍යභිචාරී තහංචි මේ අතර වැදගත් තැනක් ගනී. මින් පැහැදිලි කරන්නේ සමාජයේ සාමාජිකයන් අතර පවතින ලිංගික සම්බන්ධතා වල ස්වභාවයයි. ඥාතිත්ව රටා අනුව සමහර ලිංගික සම්බන්ධතා සමාජය විසින් පිළිගනු නොලැබේ. අප ඒවායින් වැළකී සිටිය යුතුය.

හැරී එම්. ජොන්සන් විසින් විස්තර කර ඇති සමාජ ව්‍යුහයේ අවසාන අංගය සංස්කෘතික වටිනාකම්ය. සෑම සමාජයකම ඊට අනන්‍ය වූ සංස්කෘතික අගනාකම් ඇත. එම වටිනාකම් වශයෙන් හැඳින්වෙන්නේ සමාජයේ සාමාජිකයන් විසින් අප මෙසේ කළ යුතු යයි යනුවෙන් ගන්නා තීරණයන්ය. සමාජයේ වෙසෙන අය වටිනාකම් කෙරෙහි ප්‍රතිචාර දක්වන්නේ චිත්තවේගී වශයෙනි. මෙකී. වටිනාකම් පිළිබඳව පොදු අවබෝධයක් සමාජයේ පැවතිය ද සමාජයේ සාමාජිකයන් අතර යම් යම් ගැටුම්කාරී තත්ත්වයන් මතුවිය හැකිය. මීට හේතු වන්නේ. සමාජයේ දිවිගෙවන සාමාජිකයන් තුළ සංස්කෘතික වටිනාකම් කෙරෙහි ඇති ආකල්පවල විවිධත්වයයි.

ඉහතින් සඳහන් කරන්නට යෙදුනු කරුණු අනුව සමාජ සම්බන්ධතාවන්ගෙන් යුක්ත සංකීර්ණ පද්ධතියක් හෙවත් කාර්ය කොටස් පද්ධතියක් ලෙස සමාජ විග්‍රහය තේරුම් ගත හැකිය. සමාජයේ පවතින නීතිරීති හැදෑරීමට සමාජ ව්‍යුහය ගැන හැදෑරීම ලෙස අවසන් වශයෙන් සඳහන් කළ හැකිය.